සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

28 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
Second Term Test - Grade 13 - 2019

විභාග අංකය .... ගෘහ ආර්ථික විද්‍යාව I කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. පුද්ගලයෙකුගේ පවුලේ සාමාජිකයින් හා පවුලෙන් පරිබාහිර සමායේ සාමාජිකයින්ගේ සිතුම්, පැතුම් සමාජ හැසිරීම් හා ඔවුන්ගේ රුචි අරුචිකම් ඇතුලත් පරිසයරය වන්නේ,
    1. භෞතික ජීවන පරිසරය 2. ප්‍රසන්න ජීවන පරිසරය 3. සමාජ ජීවන පරිසරය
    4. ප්‍රශස්ථ ජීවන පරිසරය 5. සමාජ ආර්ථික පරිසරය

02. නව නිර්මාණයකදී පවත්නා ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හා ගැලපීමට අදාල උපයෝගිතා සාධකය කුමක්ද?
    1. කාල අවකාශ නිර්ණය කිරිම. 2. වටිනාකම් පද්ධතිය
    3. අනුකූලත්වය ලෙසය. 4. සැකැස්ම හා පිහිටීම ලෙසය.
    5. සමානුපාතික බව ලෙසය.

03. පහත සඳහන් වැකි අතරින් නිරවද්‍ය ප්‍රකාශය කුමක්ද?
    1. කහ වර්ණය හා කොල වර්ණය මිශ්‍ර වීමෙන් තෘතියික කහ සෑදේ.
    2. ප්‍රාථමික වර්ණයක් හා ඊට විරුද්ධ ද්විතියික වර්ණයක් සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කිරිමෙන් අන්තර් මාධ්‍යමික වර්ණ සෑදේ.
    3. වර්ණ චක්‍රයට අයත් වන අළු, දුඹුරු, කළු, සුදු වර්ණ උදාසීන වර්ණ වේ.
    4. කළු පැහැයේ සිට සුදු පැහැය දක්වා වර්ණයේ තද බව අඩු වන විට වටිනාකම වැඩි වේ.
    5. වර්ණයක දීප්තිමත් බව හෝ ලා බව තීව්‍රතාවයයි.

04. නිර්මාණකරණයේදී දේශීය සම්ප්‍රදායික වටිනාකම් වලට ප්‍රමුඛතාවය දුන් අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,
    1. දළදා මාලිගාව 2. ජාතික කෞතුකාගාරය
    3. ලිබර්ටි ප්ලාසාගොඩනැගිල්ල 4. බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාව
    5. පාර්ලිමේන්තුව

05. පහත සඳහන් වරණ අතුරෙන් කිරිවල අඩංගු කාබෝහයිඩ්‍රේට් වර්ග දෙක කුමක්ද?
    1. මෝල්ටෝස් හා ග්ලැක්ටෝස් ය. 2. ලැක්ටෝස් හා ග්ලැක්ටෝස් ය.
    3. ලැක්ටෝස් හා මෝල්ටෝස් ය. 4. ලැක්ටොස් හා පෙක්ටීන් ය.
    5. ග්ලැක්ටෝස් හා පෙක්ටීන් ය.

06. ප්‍රෝටීන්වල තැනුම් ඒකකය වනුයේ,
1. පෙප්ටයිඩ 2. ඇමයිනෝ අම්ල 3. පොලිපෙප්ටයිඩ
4. ඩයිපෙප්ටයිඩ 5. ට්‍රයිපෙප්ටයිඩ

07. කහ පැහැති එළවළු පළතුරුවල බහුලව අඩංගු විටමිනය කුමක්ද?
1. රෙටිනෝල් ය. 2. ඇස්කෝබික් අම්ලය 3. බීටා කැරෝටින් ය.
4. බයොටීන් ය. 5. ටෙකෝෆෙරෝල් ය.

08. මන්ද බුද්ධික දරුවන් බිහිවීම හා කථන ආබාධ දරුවන් බිහිවීම සඳහා බලපාන ඛණිජ ලවණය කුමක්ද?
1. යකඩ 2. සින්ක් 3. අයඩින්
4. කැල්සියම් 5. පොස්පරස්

09. ශරීරයේ පේශී ක්‍රියාකාරිත්වය සඳහා උදව්වන ප්‍රෝටීනමය සංයෝග දෙකකි.
1. කේසීන් හා ඇක්ටින් 2. මයොසීන් හා කේසීන් 3. කේසීන් හා ඇල්බියුමින්
4. ඇල්බියුමින් හා මයොසීන් 5. ඇක්ටින් හා මයොසීන්

10. බෙනඩික් ද්‍රාවණය භාවිතා කර පරීක්ෂා කරනු ලබන පෝෂක සංඝටකය කුමක්ද?
1. ප්‍රෝටීන් ය. 2. මේදය 3. පිෂ්ඨය ය.
4. ග්ලූකෝස් ය. 5. පෙක්ටීන් ය.

11. බිත්තරවල පෝෂණමය අගය හා සම්බන්ධ සිසුන් ලියන ලද කරුණු කිහිපයක් පහත දැක්වේ.
A. විටමින් C බහුලව අඩංගු වේ.
B. ජෛව අගයෙන් ඉහල ප්‍රෝටීන් අඩංගු වේ.
C. ප්‍රතිඔක්සිකාරක අඩංගුය.
D. යකඩ හා සල්ෆර් සපයයි.
E. මධ්‍යස්ථ කැලරි ප්‍රමාණයක් ලබාදේ.
මේ අතුරින් නිවැරදි කරුණු වනුයේ,
1. A, C, D ය. 2. A, B, D ය. 3. B, C, E ය. 4. B, D, E ය. 5. C, A, D ය.

12. කාබෝහයිඩ්‍රේට් ජීර්ණ එන්සයිම පිළිවෙලින් දක්වන කාණ්ඩය මින් කුමක්ද?
1. ඇමයිලේස්, ලයිපේස්, මෝල්ටේස් 2. ඇමයිලේස්, පෙප්සින්, ලැක්ටේස්
3. ඇමයිලේස්, මෝල්ටේස්, ලැක්ටේස් 4. ඇමයිලේස්, සුක්රේස්, පෙප්සින්
5. ඇමයිලේස්, මෝල්ටේස්, පෙප්සීන්.

13. මේද හා ප්‍රෝටීන් ජීර්ණය ආරම්භ වනුයේ,
1. ග්‍රහනිය හා ශ්‍රේෂාන්ත්‍රය තුළදී ය. 2. ශේෂාන්තර හා ශුන්‍යාන්තර තුළදීය.
3. ආමාශය හා ග්‍රහනිය තුළදී ය. 4. ග්‍රහනිය හා ආමාශය තුළදීය.
5. ආමාශය හා ශේෂාන්ත්‍ර තුළදී ය.

14. ප්‍රාථමික පාසලක සිසුන් කණ්ඩායමක් නිරීක්ෂණය කිරීමේදී හඳුනාගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.
- අධික ලෙස විඩාවට පත් වීම.
- ශරීර වර්ධනය අඩු වීම.
- අවධානය හා මතක තබා ගැනීමේ ශක්තිය අඩුවීම.
- පහසුවෙන් ලෙඩ රෝග වලට ගොදුරු වීම.
- සුදුමැලි ස්වභාවයක් ගැනීම.

ඉහත ඌණතා ලක්ෂණ පෙන්නුම් කරන පෝෂකය නම් කරන්න.
1. ප්‍රෝටීන් ය. 2. අයඩීන් ය. 3. කැල්සියම් ය.
4. යකඩ ය. 5. සින්ක්

15. ශ්‍රී ලංකාවේ පෝෂණ ඌණතා බහුලව පවතින දිස්ත්‍රික්ක අයත් කාණ්ඩය කුමක්ද?
1. නුවර එළිය, බදුල්ල, ත්‍රිකුණාමලය, මඩකලපුව
2. ත්‍රිකුණාමලය, නුවරඑළිය, බදුල්ල කෑගල්ල
3. කෑගල්ල, රත්නපුරය, බදුල්ල, පුත්තලම
4. මඩකලපුව, බදුල්ල, මහනුවර, පුත්තලම
5. පුත්තලම, නුවරඑළිය, බදුල්ල, කෑගල්ල.

16. නිවැරදි ජීවන රටාවක් වනුයේ,
1. උදෑසන ආහාරය අනිවාර්යෙන් ගැනීම.
2. ක්ෂණික ආහාරවලින් වැළකීම.
3. ශරීර ස්කන්ධය පාලනය කර ගැනීම.
4. දිනකට ආහාර වේල් කිහිපයක් ගැනීම.
5. විවිධ පලතුරු වර්ග දිනපතා ආහාරයට ගැනීම.

17. ජීවන චක්‍රයේ විශේෂ පෝෂණ අවශ්‍යතා සහිත පුද්ගලයන් ලෙස දක්වන්නේ,
1. ගර්භණී හා ක්ෂරණ මව්වරු
2. මහලු පුද්ගලයින් හා පසු ළමා වියේ දරුවන්
3. මුල් ළමා විය දරුවන් හා පසු ළමා විය දරුවන්
4. යෞවන හා වැඩිහිටි වියේ අය
5. වැඩිහිටි හා ක්ෂීරණ මව්වරු

18. පිෂ්ඨය, සීනි, ප්‍රෝටීන්, වියළි තාපයට භාජනය කිරීමේදී නිරීක්ෂණය කළහැකි විපර්යාස පිළිවෙලින් ඇති කාණ්ඩය කුමක්ද?
1. ඩෙක්ස්ට්‍රිකරණය, කැරමලිකරණය, හැකිලීම
2. ජෙලටිනිකරණය, හැකිලීම, කැරමලිකරණය
3. හයිඩ්‍රජනීකරණය. ජෙලටිනීකණය, හැකිලීම
4. තෛලෝදකරණය, කැරමලිකරණය, හැකිලීම
5. ජෙලටනිකරණය, ඩෙක්ස්ට්‍රිකරණය, කැරමලිකරණය

19. නිමි ඇඳුම්වල තත්ත්ව පරීක්ෂාව සිදු කිරීමේදී කරනු ලබන පරීක්ෂාවකි.
1. උණුසුම් තෙරපීම ලබා දීම
2. අනවශ්‍ය නූල් කපා දැමීම
3. ක්ලිප් ගැසීම
4. විවර පියවීමේ ක්‍රම
5. අල්පෙනෙති ගැසීම

20. ඇසුරුම් බෑග්වල (සහල් බෑග්වල) ඉහළ සහ පහළ විවෘතව ඇති කොටස් මැසීමට යොදා ගනු ලබන මැහුම් ක්‍රමයකි.
1. අත් මැස්ම
2. අඟුලු මැස්ම
3. අක්වක් අඟුලු මැස්ම
4. තනි නූලේ දම්වැල් මැස්ම
5. නොපෙනෙන මැස්ම

21. ඇඳ ඇතිරිලි සඳහා වඩාත් සුදුසු රෙදි වර්ග දෙකක් වනුයේ
1. ඕර්ලෝන් හා කපු රෙදිය
2. ටෙරලින් හා ලිනන් රෙදිය.
3. ඕර්ලෝන් හා ලිනන් රෙදිය
4. කපු හා ලිනන් රෙදිය.
5. කපු හා ටෙරලින් රෙදිය

22. මේස ඇතිරිල්ලේ මේසයේ අද්දරින් පහතට වැටෙන ප්‍රමාණය (rope) වනුයේ,
1. 35 cm
2. 30 cm
3. 25 cm
4. 40 cm
5. 20 cm

23. ද්‍රවායන කැටීම මගින් සකස් කරනු ලබන කෙඳි වර්ග දෙකකි.
1. ඇස්බැස්ටෝස් හා නයිලෝන් ය.
2. නයිලෝන් හා පොලිඑස්ටර්
3. පොලිඑස්ටර් හා ඇස්බැස්ටෝස්
4. පොලිඑස්ටර් හා ඇරම්ඩ්
5. ඇස්බැස්ටෝස් හා ස්පැන්ඩෙක්ස්

24.



ඉහත දක්වා ඇති වියමන් ක්‍රමය වන්නේ,

1. ජටා වියමන   2. දික්දාර වියමන   3. සැටින් වියමන
4. හිරි වියමන   5. සැටීන් වියමන්

25. කෙටි සාය පතරොම නිර්මාණයේදී ලබාගත යුතු සිරස් මිම් වන්නේ,

1. උකුල් එල්ලය, සායේ උස   2. ඉණ සිට උකුල දක්වා උස, අංශ උස
3. ඉණ මිනුම, උකුල්, එල්ලය.   4. ඉණ සිට උකුල දක්වා උස, පෙරමැද උස
5. සායේ උස, අංශ උස

26. කෙටි සායේ වාටිය සඳහා තබන මැහුමේ වාසිය කොපමණද?

1. 7 cm   2. 2 cm   3. 8 cm   4. 5 cm   5. 3 cm

27. ඇක්‍රිලීන් කෙඳි දැල්වීමෙන් පසු දිස් වනුයේ,

1. උණු නොවන සුළු බව   2. ද්‍රව වීම හා හැකිලීම
3. අළු ගුලියක් මෙන් සකස් වේ.   4. උණු වී පිලිස්සේ
5. අළු අගුරු මෙන් ඉතිරි වේ.

28. ලිඛිත සන්නිවේදනයේ අවාසියකි.

1. ප්‍රතිචාර ඉක්මනින් නොලැබීම   2. තහවුරු කිරීමේ හැකියාව අඩුවීම.
3. නැවත නැවත අධ්‍යනය කිරිමට අපහසු වීම.   4. ඔප්පු කිරීමේ හැකියාව තිබීම.
5. අපැහැදිලි අවස්ථා පැහැදිලි කර ගැනීමට හැකිවීම.

29. ඉතා තද හෝ දීප්තිමත් වර්ණ සහිත ඇඳුම් පාවිච්චිය වඩාත් සුදුසු වන්නේ, මින් කුමන අවස්ථාවකදී ද?

1. සම්මුඛ පරීක්ෂණයකට යාමේදී   2. රැකියාවකට යාමේදී   3. මංගල උත්සවයකට යාමේදී
4 රාත්‍රී උත්සව අවස්ථාවකදී   5. අවමංගල උත්සවයකදී

30. අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කර ගැනීමට වැදගත් වන කුසලතාවයකි.

1. ධන බලය   2. දේශපාලන බලය   3. ප්‍රියමනාප බව
4. සාරධර්ම   5. සංසන්දි කථිකාව

31. සංකාසනය යනු,

1. උචිත ලෙස පෙනී සිටීමයි.   2. ගැටළු විසදා ගැනීමයි.   3. සාමුහික බවයි.
4. විශ්වාසය හා ප්‍රියමනාප බවයි.   5. තීරණ ගැනීමේ හැකියාවයි.

32. ක්ෂුද්‍ර ජීවින්ගේ වර්ධනය සඳහා බලපාන බාහිර සාධකයක් වනුයේ.

1. සාපේක්ෂ ආර්ද්‍රතාවය   2. P.H අගය   3. තෙතමනය
4. ඔක්සිකරණ / ඔක්සිහරණ විභවය   5. පෝෂණ ද්‍රව්‍ය ප්‍රමාණය

33. ලිපිඩ සහිත ආහාර ඔක්සිජන්වලට හෝ ආලෝකයට නිරාවරණය වීම නිසා වියෝජනයට ලක් වී වෙනත් සංයෝග සෑදීම.
1. ස්වයං ඔක්සිකරණයකි. 2. එන්සයිමීය ඔක්සිකරණයයි. 3. ජල විච්ඡේදනයයි.
4. ඔක්සිහරණයයි. 5. ස්වයං වියෝජනයයි.

34. එළවළු වියළීම, ටින් කිරීම, අධිශීත කිරීම ආදී පරිරක්ෂන ක්‍රමවලද පූර්ව ප්‍රතිකාරකයක් ලෙස භාවිතා කරන්නේ,
1. ජීවානුහරණය 2. සුබ්‍රිකරණය 3. පැස්ටරීකරණය
4. ඔක්සිකරණය 5. ප්‍රවිකිරණය

35. උපරිතාප ක්‍රමයෙන් පරිරක්ෂණය කළ ආහාරයකි.
1. පලතුරු 2. මස් 3. මාළු 4. එළවළු 5. දියරමය නැවුම් කිරි

36. ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාසවල නිරත වීම හඳුන්වන්නේ,
1. භෞතික විවේකය යනුවෙනි. 2. මානසික විවේකය යනුවෙනි. 3. ප්‍රජානන විවේකය යනුවෙනි.
4. කායික විවේකය යනුවෙනි. 5. සාමාජීය විවේකය යනුවෙනි.

37. ගෘහස්ථ නොවන ප්‍රතිමෝදන ක්‍රියාවලට උදාහරණයකි.
1. විවේකය සඳහා රිය පැදවීම. 2. ගෙවතු වගාව 3. ස්වයං නිර්මාණය සැකසීම
4. ප්‍රිය සම්භාෂණවලට සහභාගී වීම. 5. සංගීතයට සවන් දීම.

38. ප්‍රතිමෝදන ක්‍රියාකාරකම් වර්ගීකරණයේදී චිත්‍ර ඇඳීම්, මැටි භාණ්ඩ සෑදීම, ලී වැඩ, බතික් රෙදි, පිත්තල වැඩ ආදිය අයත් වන්නේ,
1. රංග කලා ක්‍රියාවලටය. 2. කලා හා ශිල්ප ක්‍රියාවලටය.
3. සාමාජීය ක්‍රියාවලටය. 4. සේවා ක්‍රියාවලටය.
5. එළිමහන් ක්‍රියාවලටය.

39. සංචරණය මගින් සංචරණයෙහි යෙදෙන පුද්ගලයාට හා සමාජයට අත්වන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.
A පූර්ණ සහ අර්ථවත් ජීවිතයකට දායක වීමට හැකිවීම.
B ඍජු හා වක්‍ර රැකියා අවස්ථා උදාවීම.
C සන්නිවේදන නිපුනතා දියුණු වීම.
D ශක්තිමත් සමාජ කණ්ඩායම් ගොඩ නැගීම.
E අන්තර් පුද්ගල සබඳතා දියුණු කිරීම.
මෙම කරුණු අතරින් සමාජයට ලැබෙන ප්‍රතිලාභ ඇතුලත් පිළිතුර කුමක්ද?
1. A C D 2. B D 3. B C D 4. C E 5. C A B

40. කඳු නැගීම, කිමිදීම, පර්වත තරණය, වැසි වනාන්තරවල ඈත ස්ථාන කරා යාම හඳුන්වන්නේ,
1. ස්වභාව ධර්ම සංචරණය ලෙසය. 2. අජටාකාශ සංචරණය ලෙසය.
3. ප්‍රයාන සංචරනය ලෙසය. 4. රුදෙස් සංචරණය ලෙසය.
5. අධ්‍යාපනික සංචරණය ලෙසය.

41. ජලයේ යෝග්‍යතාව බැලීම සඳහා කරන භෞතික පරීක්ෂණයකි.
1. ජලයේ උෂ්ණත්වය බැලීම 2. ජලය විශ්ලේෂණය කිරීම මගින් PH අගය බැලීම.
3. කාබනික හා අකාබනික ද්‍රව්‍ය ප්‍රමාණය 4. ජලයේ අඩංගු ජීවින් පිළිබඳ පරීක්ෂණ
5. කෘෂි රසායන අඩංගු ප්‍රමාණයන් ගණනය

42. ජලයේ අපිරිසිදු බවට හේතු වන බැක්ටීරියා විශේෂයකි.
1. සැල්මොනෙල්ලා 2. ඊකෝලයි. 3. ක්ලොට්‍රිඩියම් බොටියුලිනම්
4. ෂිගෙල්ලා 5. මයිකෝබැක්ටීරියම්

43. මූලික විදුලි සැපයුමෙන්, ගෘහ විද්‍යුත් පරිපථයට ලැබෙන විදුලිය සම්බන්ධ කිරීම හෝ විසන්ධි කිරීම සිදුවන උපකරණය කුමක් ද?

1. සිගිති පරිපථ බිඳිනය.
2. ශේෂධාරා පරිපථ බිඳිනය
3. විදුලි මීටරය
4. විලායකය
5. ප්‍රධාන ස්විච්ය

44. විද්‍යුත් උපකරණයක් තත්පර එකකදී සිදු කරනු ලබන කාර්ය ප්‍රමාණය හඳුන්වනු ලබන්නේ,

1. විභව අන්තරය ලෙසය
2. ඉලෙක්ට්‍රෝන පීඩන වෙනස
3. ක්ෂමතාව
4. ප්‍රතිරෝධය
5. ධාරව ලෙසය.

45. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් විදුලි බිල්පත හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

1. ගෘහස්ථ පරිභෝජනය සඳහා කට්ටි කරන ලද අය කිරීම් ක්‍රමයක් භාවිත වේ.
2. විදුලි බිල්පත් සැකසීම මහජන උපයෝගිතා කොමිසම මගින් සිදු කෙරේ.
3. විදුලිය පරිභෝජනයේදී වැය වන ඒකක ප්‍රමාණය අනුව ගෙවීය යුතු මුදල තීරණය කිරීම.
4. සෑම බිලකම ස්ථාවර මාසික ගාස්තුවක් අය නොකෙරේ.
5. විදුලි ඒකක ලෙස හැඳින් වෙන්නේ කිලෝවෝට් පැය එකකි.

46. රූපවාහිනියක ක්ෂමතාවය 150w වේ. මෙය පැයක් භාවිතා කළ විට වැය වන ශක්ති ප්‍රමාණය කිලෝවොට් පැය,

1. 0.15 යි.
2. 0.52 යි.
3. 0.375 යි.
4. 1.25 යි.
5. 2.34 යි.

47. පුනර්ජනනීය සම්පත් පමණක් ඇති පිළිතුරු තෝරන්න.

1. ඔක්සිජන්, දැව, සත්ත්ව හා ශාක සම්පත්, සුළං
2. ගල් අඟුරු, ජෛව ස්කන්ධ, ලෝහමය ඛනිජ, දැව
3. සුළං, වනාන්තර, ප්ලාස්ටික්, පෙට්‍රෝලියම්
4. සූර්ය ශක්තිය, කපු පිළි, පොසිල ඉන්ධන, ප්ලාස්ටික්
5. පෙට්‍රෝලියම්, සූර්ය ශක්තිය, ගල් අඟුරු, ඔක්සිජන්

48. කාබනික ගොවිතැනේදී භාවිතා කළ හැකි ස්වභාවික යෙදවුම් පමණක් ඇති පිළිතුර තෝරන්න.

1. පරිසර හිතකාමී වගා රටා, පොහොර, ප්‍රතිජීවක
2. රසායනික පලිබෝධ නාශක, කාබනික පොහොර, වර්ධන හෝර්මෝන
3. ජාන විකරණය කළ ජීවීන්, ජෛව පලිබෝධ නාශක පොහොර
4. කාබනික පොහොර, ජෛව පලිබෝධ නාශක, පරිරස හිතකාමී වගා රටා
5. වර්ධක හෝමෝන, කාබනික පොහොර, ප්‍රතිජීවක

49. වඩාත් බහුල ජෛව ක්‍රියාකාරී සංයෝග වන ප්‍රීබයෝටික් හා ප්‍රොබයෝටික් අඩංගු ආහාර ප්‍රභවයකි.

1. යෝගට් හා වෙනත් කිරි නිෂ්පාදන
2. සීනි හා කිරි ආහාර
3. මාළු හා සීනි අඩංගු ආහාර
4. කෙසෙල් හා සීනි අඩංගු ආහාර
5. පාන් හා සහල් නිෂ්පාදන

50. පාංශු වසුන් ලෙස යොදාගතහැකි ඖෂධ පැළෑටියකි.

1. කොහොඹ, ගම්මාලු
2. අක්කපාන, කෝමාරිකා
3. ගොටුකොළ, හතාවාරිය
4. උඳුපියලිය, තිප්පිලි
5. පාවට්ටා, කහ

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

28	S	II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 13 - 2019

විභාග අංකය ....

ගෘහ ආර්ථික විද්‍යාව II

කාලය පැය තුනයි

උපදෙස්:- I කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.**

01.

I. අභ්‍යන්තර අවකාශය නිර්මාණයේදී සැලකිය යුතු සාධක දෙකක් සඳහන් කරන්න.

II. ප්‍රතිරෝධය යන්න හඳුන්වා ප්‍රතිරෝධය මනින ඒකකය සඳහන් කරන්න.

III. ක්ෂුද්‍ර පෝෂක ඌනතාවයක් වන නීරක්තිය ඇතිවීමට හේතු දෙකක් දක්වන්න.

IV. ස්ථූලතාවය නිසා ඇතිවන බෝ නොවන රෝග 04 ක් සඳහන් කරන්න.

V. වානිජ මැහුම් ක්‍රමවල පෙනුම හා ක්‍රියාකාරීත්වයට බලපාන වැදගත් සාධක දෙකක් ලියන්න.

VI. සේද කෙඳි පිලිස්සීමේදී දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

VII. ප්‍රතිමෝදනය වැදගත් වීමට හේතු දෙකක් දක්වන්න.

VIII. සම්පත් අවභාවිතය යනු කුමක්ද?

IX. ව්‍යාපාර ආචාරධර්ම වලට උදාහරණ දෙකක් සඳහන් කරන්න.

X. හරිතාගාර ආචාරණය නිසා ඇතිවන ප්‍රතිවිපාක දෙකක් ලියන්න.

02. I. භෞතික ජීවන පරිසරයෙහි මූලික කොටස් තුනක් නම් කරන්න.

II. ජල අවශ්‍යතාවයන් කාණ්ඩ කර දක්වන්න.

III. අප ජලය යනු හඳුන්වා අපජලය උත්පාදනය වන මූලාශ්‍ර 03 ක් නම් කරන්න.

IV. විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමේ ක්‍රම 05 ක් දක්වන්න.

03. I. බහුලව දැකිය හැකි පොලිසැකරයිඩ නම් කරන්න.

II. ප්‍රෝටීන් පරිපූරණය පැහැදිලි කරන්න.

III. ලිපිඩ හඳුනාගැනීමේ සරල හා රසායනාගාර පරීක්ෂණ විස්තර කරන්න.

IV. මන්ද පෝෂණය පාලනය කිරීම සඳහා භෝජන රටාවෙහි කළයුතු වෙනස්කම් 05 ක් සඳහන් කරන්න.

04. I. ආහාර ආසාදනය හඳුන්වන්න.

II. පැසීම සඳහා භාවිතා වන විවිධ ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ 04 ක් නම් කරන්න.

III. දිනෙන් දින ජල ඉල්ලුම වැඩිවේ. එසේ වීමට බලපාන හේතු 04 ක් සඳහන් කරන්න.

IV. ආහාර ජාන විකිරණය යන්න හඳුන් වන්න. එවැනි ආහාර සඳහා නිදසුන් 04 ක් සඳහන් කරන්න.

05. I. නිම් ඇඳුම් කර්මාන්තශාලා වල භාවිත වන මහන යන්ත්‍රවල කොටස් නම් කරන්න.
    II. GSP + සහනය විස්තර කරන්න.
    III. ලිනන් ස්භාවික කෙදි යටතට ගැනේ. හඳුන්වන්න.
    IV. කෙටිසාය මැසීමේ මුල් පියවර 05 ක් අනුපිලිවෙලින් සඳහන් කරන්න.

06. I. නිර්මාණකරණයේ මූලධර්මයකි සමෝධානය. පැහැදිලි කරන්න.
    II. බාහිර අවකාශ නිර්මාණය සඳහා ස්භාවික ශාක යොදාගන්නා ආකාරය සඳහන් කරන්න.
    III. සංචරණය මගින් සමාජයට අත්වන ප්‍රතිලාභ මොනවාද?
    IV. සංචාරක සේවා සැපයීමේදී උපකාරක සේවා සඳහන් කරන්න.

07. I. තිරසර සම්පත් පාරිභෝජනයේදී අනුගමනය කරනු ලබන කරුණු සඳහන් කරන්න.
    II. පුනර්ජනනීය සම්පත් පිළිබඳ කරුණු හතරක් ඉදිරිපත් කරන්න.
    III. හරිතාගාර ආවරණය වේගවත් කරන මිනිස් ක්‍රියාකාරකම් හතරක් ලියන්න.
    IV. හරිත පාරිභෝගිකයෙකු වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත් පැහැදිලි කරන්න.

08. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් හතරකට කෙටි සටහන් ලියන්න.
    I. නිර්මාණයක සාර්ථකත්වය සඳහා බලපාන තුලනය හඳුන්වන්න.
    II. තිරිඟු පිටි ආශ්‍රිතව සකස්කල පිටිමෝලි වර්ග හතරක් නම් කර ඒවාට උදාහරණ එක බැගින් දෙන්න.
    III. අච්චු මුද්‍රණය පැහැදිලි කරන්න.
    IV. ආහාර පිළිගැන්වීමේ දී සැලකිලිමත්විය යුතු කරුණු මොනවාද?
    v. ගුණාත්මක බවින් යුතු ආහාර පරිභෝජනයේදී කාබනික ගොවිතැන් ක්‍රමයෙහි වැදගත්කම පහදන්න.

දෙවන වාර පරීක්ෂණය - 2019
ගෘහ ආර්ථික විද්‍යාව 13 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය.
I කොටස.

01. - 3	**11.** - 4	**21.** - 4	**31.** - 1	**41.** - 1
02. - 3	**12.** - 3	**22.** - 2	**32.** - 1	**42.** - 2
03. - 4	**13.** - 4	**23.** - 2	**33.** - 1	**43.** - 5
04. - 1	**14.** - 4	**24.** - 4	**34.** - 2	**44.** - 3
05. - 2	**15.** - 1	**25.** - 1	**35.** - 5	**45.** - 4
06. - 2	**16.** - 3	**26.** - 5	**36.** - 1	**46.** - 1
07. - 3	**17.** - 1	**27.** - 3	**37.** - 1	**47.** - 1
08. - 3	**18.** - 1	**28.** - 1	**38.** - 2	**48.** - 4
09. - 5	**19.** - 4	**29.** - 4	**39.** - 2	**49.** - 1
10 - 4	**20.** - 4	**30.** - 5	**40.** - 3	**50.** - 4

II කොටස

01.

I. පාරිසරික සාධක පාලනය කළහැකි මට්ටමික අවකාශයක් වෙන්කර ගැනීම.
යම්කිසි නිශ්චිත ක්‍රියාවලින් සඳහා සුදුසු පරිදි අවකාශ සකස් කර ගැනීම.
අවට පරිසරය සමඟ ප්‍රශස්ත සම්බන්ධතාවයක් නිර්මාණය කර ගැනීමට හැකිවීම.
ශක්ති හානි අවම වීම.
භාවිතා කරන්නන්ට ප්‍රසන්න හා සුවපහසු වන පරිදි ප්‍රශස්ත පරිසරයක් නිර්මානය කර ගැනීම. (ල.02)

සන්නායකයක් තුළින් විදුලි ධාරාවක් ගලායාමට දක්වන බාධාව ප්‍රතිරෝධය ලෙස හැඳින්වේ. ඕම් Ω ඒකකය ලෙස දැක්වේ. (ල.02)

II. යකඩ අඩංගු ආහාර ගැනීම අඩුවීම.
ආහාරවේලේ අඩංගු යකඩ ප්‍රමාණවත් ලෙස ශරීරයට අවශෝෂණය නොවීම.
අධික ලෙස / දීර්ඝ කාලීන රුධිර පීඩනය
පරපෝෂිත ආසාදන (කොකුපණු) (ල.02)

අධිරුධිර පීඩනය, අඝාතය, මාසික අසහනය, හෘදයාබාධ, පිළිකා (ල.02)

මැස්මේ පීඩනය, මැස්මේ ආතතිය, මැස්මේ ඒකාකාරී බව (ල.02)

පිහාටු පිලිස්සන ගඳක් ඇතිවේ. සෙමින් පිලිස්සේ අළු අඟුරු මෙන් ඉතිරි වේ. (ල.02)

III. කායික, මානසික, විඩාව සමනය කර ගැනීමට හැකිවීම.
විවේක කාලය තුළ නියැළෙන ක්‍රියාකාරකම් තුලින් සතුට විනෝදය ලැබීම.
නව අත්දැකීම් ලබා ගැනීමට හැකි වීම (ල. 02)

IV. සම්පත් අධික ලෙස භාවිතය, විනාශකාරී ලෙස භාවිතය හෝ සම්පත් තුල හෝ අතර ඇති අසමතුලිතභාවය හෝ අවභාවිතයයි. (ල. 02)

V. ගනුදෙනු කිරිමේ පාරදෘශ්‍ය බව
තොරතුරු වල රහස්‍ය බව සුරැකීම (ල. 02)

VI. අයිස් කඳු දියවී යාම (ග්ලැසියර් දියවීම)
මුහුදු ජල මට්ටම ඉහළ යාම නිසා සමහර රටවල් ජලයෙන් යටවීම.
හරිතාගාර වායු නිසා ඕසෝන් ස්ථරයට හානි සිදුවීම.
අහිතකර පාරජම්බුල කිරණ පෘථිවියට පැමිණීම හේතුවෙන් චර්ම රෝග, පිළිකා ඇති වීම. (ල. 02)

(මුළු ලකුණු 10 x 02 = 20)

02. I. අභ්‍යන්තර අවකාශ නිර්මාණය, ගොඩනැගිලි හා භූ දර්ශන නිර්මාණය, ග්‍රාමීය හා නාගරික පරිසර නිර්මාණය. (ල. 03)

II. මූලික අවශ්‍යතා - පානය, ආහාර පිළියෙල කිරීම.
ද්විතික අවශ්‍යතා - නෑම, සේදීම හා වැසිකිළි අවශ්‍යතා
තෘතියික අවශ්‍යතා - සතුන් නැවීම, වාහන සේදීම (ල. 03)

III. සනීපාරක්ෂක උපාංගයකට නළ ජලය මගින් සපයන ජලය, සේදීම හෝ නෑම වැනි කාර්යයන් සඳහා පාවිච්චි කළ විගස අප ජලයට බවට පත් වේ. (ල. 02)
මූලාශ්‍ර - වැසිකිළිවලින් පිටවන ජලය, නෑමට යොදාගත් ජලය, මුළුතැන්ගෙයි හෝ සේදීමට යොදාගත් ජලය (ල. 03)

IV. දිවා කාලයේ ස්වභාවික ආලෝකය ලබා ගැනීම. දිනපතා රෙදි මැදීම වෙනුවට සතියකට වරක් රෙදි මැදීම.
ශීතකරණ දොර වරින් වර විවෘත නොකිරීම. වායුසමීකරණ යන්ත්‍ර වෙනුවට විදුලි පංකා භාවිතය
වැඩි වෝල්ටීයතාවයක් සහිත විදුලි උපකරණ අවම කිරීම.
සූත්‍රිකා බල්බ වෙනුවට CFL බල්බ හෝ LED බල්බ යොදා ගැනීම.
විදුලි උපකරණ දුරස්ථ පාලක වලින් ක්‍රියා විරහිත කොට ස්විචයෙන්ද ක්‍රියා විරහිත කිරීම. (ල. 05)
(මුළු ලකුණු 16)

03. I. පිෂ්ටය, සෙලියුලෝස්, ග්ලයිකොජන් (ල. 03)

II. අසම්පූර්ණ ප්‍රෝටීන අඩංගු ආහාර කිහිපයක් එක්කර, නියමිත ප්‍රමාණයන්ගෙන් අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ල ලැබෙන සේ ආහාර සකස් කර ගැනීම.
උදා:- මුං කිරිබත්, මුං ඇටවල මෙතියොනීන් ඌන අතර ලයිසීන් අන්තර්ගතය සහල්වල ලයිසීන් ඌන අතර මෙතියොනින් අන්තර්ගතය (ල. 04)

III. සරල පරීක්ෂණ
ලිපිඩ අඩංගු ආහාරයක් තුනී කඩදාසියක් මත තබා තෙරපූ විට එම කඩදාසියේ පාරභාෂක තෙල් පැල්මක් දිස්වේ.
රසායාගාර පරීක්ෂණ
ලිපිඩ සහිත ආහාරයකට සුඩෑන් III ද්‍රාවණය බිංදු කිහිපයක් එක්කර හොඳින් සෙලවූ විට එය රතු තැඹිලි වර්ණයක් පෙන්නුම් කරයි. (ල. 04)

IV. ප්‍රමාණවත් ලෙස පෝෂ්‍යදායී ආහාර ලබා ගැනීම. ජෛව අගයෙන් උසස් ප්‍රෝටීන ලබාදීම
අධි ප්‍රෝටීන පාන වර්ග ලබාදීම. කැලරි හා අනෙකුත් ක්ෂුද්‍ර පෝෂක ලබාදීම.
කොළ සහ කහ පැහැති එළවළු පලතුරු ලබාදීම බටර්, මාගරින්, සීනි, පැනිරස ආහාර ලබා ගැනීම.
(ල. 05)
(මුළු ලකුණු 16)

04. I. පාරිභෝජනයට ගන්නා ආහාරයක් සමග ක්ෂුද්‍ර ජීවීන් ශරීරයට ඇතුළු වීම නිසා රෝග හටගැනීම.
උදා:- මස්, බිත්තරවල සැල්මොනෙල්ලා බැක්ටීරියා විශේෂ ශරීරගත වීමෙන් සැල්මොනෙල්ලෝසිස් රෝගය.
විබ්‍රියෝ කොලෙරා. කොළරාව (ල. 03)

II. ලැක්ටික් අම්ල නිපදවන බැක්ටීරියා මධ්‍යසාර නිපදවන බැක්ටීරියා
ඇසිටික් අම්ල නිපදවන බැක්ටීරියා ඇතැම් දිලීර විශේෂ (ල. 04)

III. ජනගහන වර්ධනය, ජීවන තත්වය ඉහළයාම, කෘෂි කර්මාන්තය ව්‍යාප්ත වීම, වෙනත් කර්මාන්ත ව්‍යාප්ත වීම. (ල. 04)

IV. ජාන තාක්ෂණය භාවිතයෙන්, ආහාර ක්ෂේත්‍රයේ විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා නිපදවූ ආහාර
රන් සහල්, කෘෂි ප්‍රතිරෝධී බීජ, ජාන විකිරණ කළ - බීට් වලින් සෑදූ සීනි, වල්නාශක, කෘමිනාශක ප්‍රතිරෝධී සෝයා බෝංචි, ඉරිඟු, කැනෝලා. (ල. 05)
(මුළු ලකුණු 16)

05. I. ඉදිකටුව, බොබිනය, පීඩන පාදය (ල. 03)

II. ඇඟලුම් අපනයන සඳහා ඒ ඒ රටවලට බද්ධක් ගෙවීමට ශ්‍රී ලංකීක ඇඟලුම් අපනයනකරුවන්ට සිදුවේ. GSP + සහන හේතුවෙන් එම බදු ප්‍රමාණය 9% පමණ අඩුවී ඇත. මේ හේතුවෙන් නිම් ඇඳුම් ආදායම් මාර්ග සංවර්ධනය වී ඇත. (ල. 04)

III. ප්ලැක්ස් ගසේ කඳේ පිටපොත්ත පල් කිරීමේ ක්‍රමයකින් ලිග්නින් ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය ඉවත් කර වේලා පීරීමට ලක්කර කෙඳි ලබාගනී. (ල. 04)

IV. ඉදිරිපස සහ පිටුපස ආර මැසීම පිටුපස මැද මූට්ටුව මැසීම
ඉණට පේසිං එක තබා මැසීම සැන ගාංචුව මැසීම
පිටුපස කැපුම මසා නිම කිරීම (ල. 05) (මුළු ලකුණු 16)

06. I. සමෝධානය යනු - වර්ණය, වයනය හා ප්‍රමාණය වැනි ලක්‍ෂණ එකිනෙක පරයා නොයන පරිදි එකිනෙක අතර ගැටුම් ඇති නොවන පරිදි ප්‍රබලත්වය සීරුමාරු කර ගනමින් සකස් කිරීම වේ. (ල. 03)

II. ඉඩ ප්‍රමාණය, හැඩය, බෑවුම, පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
ඉඩම පිහිටි ප්‍රදේශයට ආවේනික ශාක තෝරා ගැනීම.
කෘතීම බවක් දක්නට නොලැබෙන වියදම අඩු ඒවා වීම.
ශාක පිහිටුවීමේදී ඒවාගේ මුල් අතු විහිදීම පිළිබද අවධානය යොමු විය යුතුය.
විසිතුරු ශාක හා විවිධ වර්ණ සහිත ශාක තෝරා ගැනීම. (ල. 04)

III. සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උදාවීම. කුඩා පරිමාණ ව්‍යවසායකයින් හට අවස්ථා සැලැස්වීම.
රජයට අමතර බදු ආදායම් ලැබීම. ශක්තිමත් සමාජ කණ්ඩායම් ගොඩ නැගීම.
අභාවයට පත්වී යන සිරිත් විරිත් කලා ශිල්ප හස්ත කර්මාන්ත සංරක්‍ෂණය කිරීමට උදව් වීම.
නගර ආකෘතියට පෙළඹීම. (ල. 04)

IV. මූල්‍ය ආයතන (විනිමය හුවමාරු, සංචාරක චෙක්පත්, ණයවර කාඩ්පත් නිකුත් කිරිම)
සන්නිවේදන සේවා (විදුලි සංදේශ සේවා සහ අන්තර් ජාල පහසුකම්)
සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක සේවා රක්‍ෂණ ආයතනය
සංචාරක තොරතුරු සේවා පොදු ආරක්‍ෂාව (ල. 05)
(මුළු ලකුණු 16)

07. I. අවම සම්පත් භාවිතය අප ද්‍රව්‍ය දූෂක විමෝචනය සීමා කිරීම.
අනාගත පරපුරෙහි අවශ්‍යතාව සඳහා සම්පත් උවදුරට පත් නොකිරීම. (ල. 04)

II. අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නැවත භාවිතා කළහැකි ස්වභාවික සම්පතක් වීම.
ස්වභාවික ජනනය වීමේ හැකියාව තිබීම.
මුළුමනින්ම ප්‍රතිස්ථාපනය කළ හැකි හෝ ක්ෂය කළ නොහැකි සම්පතක් වීම.
කෙටි කාලයකදී ජෛවීය ප්‍රජනක ක්‍රියා හෝ ස්වභාවික උත්පාදන ක්‍රියාවලියකින් නැවත ප්‍රතිස්ථාපනය කළහැකි වීම.
භාවිතා කරන වේගයට වඩා වැඩි වේගයකින් ප්‍රජනනය වීමට හැකියාව ඇතිවීම. (ල. 04)

III. පොසිල ඉන්ධන දහනය CO_2
කාර්මිකරණයේ අතුරුඵල - Co_2 , නයිට්‍රස් ඔක්සයිඩ්
සත්ව පාලනය - මීතේන් වායවු වී වගාව - මීතේන් වායුව දැව ඉන්ධන දහනය
වනාන්තර හරණය අධික රථ වාහාන භාවිතාය (ල. 04)

IV. • කාබනික පොහොර පාරිභෝජනය • සුනිත්‍ය සහ පුනර්ජනනීය ශක්ති සම්පත් භාවිතය
• පරිසරයට අවම බලපෑමක් ඇති නිෂ්පාදන මිලට ගැනීම • එක් එක් කාලවලදී බහුල ආහාර පාරිභෝජනය
• ශක්ති පාරිභෝජනය අවම නිෂ්පාදන භාවිතය උදා:- එළවළු සලාද, පලතුරු සලාද
• පොලිත් භාවිතය අවම කිරිම. (ල. 04)

08. I. සමමිතික තුලනය, අසමමිතික තුලනය, ලෙස දෙයාකාර වේ.

සමමිතික තුලනය :- ගොඩනැගිල්ලක හෝ එහි ඇතුලත් උපාංගවල දෘෂ්‍යාබර සමමිතික ආකාරයෙන් සකස් කිරීම සමමිතික තුලනයයි.

අසම්මිතික තුලනය :- යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් සැකැස්මක් නිර්මාණයේදී දෘෂ්‍ය බර හා ප්‍රමාණ පිළිබඳ සැලකිලිමත් වෙමින් මධ්‍යලක්ෂයේ සිට අසමාන දුරින් පිහිටුවා ලීමයි. (ල. 04)

II. ෂොට්ක්‍රස්ට් පිටිමෝලිය - පැටිස්, පේස්ට්‍රි බාස්කට්

පාන් පිටිමෝලිය - හොට්ඩෝග්, බර්ගර්, මාළු පාන්

පෆ් පේස්ට්‍රිය - පේස්ට්‍රි වර්ග, සෙසේජස් වර්ග

ෂූ පේස්ට්‍රි - එක්ලෙයාස්, ක්‍රීම් බනිස්, ප්‍රොපිටරෝල් (ල. 04)

III. අච්චු සකස් කිරීම සඳහා කල් පවතින ලී, ලෝහ හෝ ලීනෝලියම් තහඩු ආධාරයෙන් සකස් කර ගනී.

අච්චු සකස් කිරීම ක්‍රම දෙකකට සිදු කළ හැක.

නිර්මාණයට අවශ්‍ය වන මොස්තරය ඉතිරි කර අනෙක් කොටස් ඉවත් කිරීම.

නිර්මාණයට අවශ්‍යවන මෝස්තරය ඉවත් කොට අනෙක් කොටස් ඉතිරි කිරීම.

අච්චුමත සායම් ආලේප කර රෙද්ද මත තබා තෙරපා මෝස්තර මතු කර ගැනීම. (ල. 04)

IV. ආහාර පිලිගන්වන ස්ථානයේ පවිත්‍රතාවය • ආහාර අලංකාරව හා ප්‍රිය ජනක ලෙස පිළිගැන්වීම.

ආහාර පිලිගන්වන උපකරණ හා මෙවලම් වල පවිත්‍රතාව

ආහාර පිළිගන්වන්නාගේ පවිත්‍රතාවය

විවිධ සංස්කෘතීන්ට අනුව ආහාර මේසය හා පිළිගැන්වීම (ල. 04)

v. රසායනික ද්‍රව්‍ය භාවිත නොකරන නිසා පස ජලය වාතය දූෂණය නොවීම.

කොම්පෝස්ට් භාවිතය නිසා සම්පත් උපරිම ලෙස භාවිත වීම.

වස විසෙන් තොර ආහාර ලැබීම.

පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රම නිසා ස්භාවික වාසස්ථාන අවම තර්ජනයකට ලක්වීම.

ජෛව විවිධත්වය වැඩිවීම.

කෘමි සතුන්ගේ හානිය අඩුවීම. (ල. 04)

(මුළු ලකුණු 16)